# ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර
# Bhiksu University of Sri Lanka - Anuradhapura

## 2017/2018 අධ්‍යයන වර්ෂය - සමාසික II පරීක්ෂණය
## ප්‍රථම වසර
## 2017/2018 Academic Year - Semester II Examination
## First Year

## සිංහල සාහිත්‍ය ප්‍රවේශය - SINH 12023

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.
එක් පිළිතුරකට ලකුණු 20 ක් පමණි. කාලය පැය 02 යි.

1. තද කළු අකුරින් මුද්‍රිත පදවලට විශේෂ අවධානයක් යොමු කරමින් පහත සඳහන් ගද්‍ය පද්‍ය පාඨ ලිහිල් බසින් ලියන්න.

I. මෙසේ ඔහු දෙදෙන ගම් බිම් ගෙවා වලටවැද නිසිතැනක් බලා ඇවිදිනාහු **පලුපල්ලවාලංකෘත ස්නිග්ධඡායා සම්පන්න සුවිමල පුලිනතලයෙන් රම්‍ය භූමි ප්‍රදේශයෙක්හි** පන්සල් කොට වාසයකළාහ. එකල්හි රාජ කන්‍යාද ඔහු පන්සලින් බැහැර නොයවා මිහිරි ඵලාඵල ගෙණවුත්දී උපස්ථානකරන්නී උදාසනක් සේ නැගී සිට පන්සල ඇමද උනුපැන් සිසිල් පැන් ආදියද දැහැටිදඬු ආදියද පිළියෙළ කොට තබා **වල්ලභයා** නැගීසිටි කල්හි මූණ සෝධවා නොයෙක් ඖෂධ ජාතීන් එක්කොට අඹරාතබා බෙහෙත්දියෙන් නාවා ආලේප කොට මධුර ඵලාඵල ගෙණවුත් දී උපස්ථාන කරන්නී උදාසනක් සේ කළ මනා වතාවත් කොට ස්වාමීනි, කළමනා අත්පාමෙහෙවර මම කෙරෙමි. නුඹවහන්සේ කනස්සලු නුවමැනවැ යි කියා පසඟපිහිටුවා වැඳ ඵලාඵල ගෙණෙන **පැස** ද අල උදුරණ උලද අතු නමාගන්න **දෙවිල්ල** ද ඇරගෙණ වලටගොස් මිහිරි ඵලාඵලයන් පැසපුරා ඇරගෙණ අවුත් පන්සල එක තැනක තබා කළය ගෙණ පැන් පුරා ගෙණවුත් නොයෙක් **බෙහෙත් සුණු** බෙහෙත් පැනින් ඒ රජහු නාවා මධුර ඵලාඵල කවා සුවඳ පැන් පොවා දඬුමැස්සේ කොළ **අතුට** මොලොක්කොට සැතපුනු කල්හි පය සෝදා මැඩ කළමනා උපස්ථාන කොට පසුව තුමූ ඵලවැල කා එම පාර්ශ්වයෙහි සැතපෙන්නීය. මෙම ක්‍රමයෙන් නිරන්තරයෙන් ස්වාමිපුත්‍රයාට උපස්ථාන කරන්නීය.

(අමරමෝලි හිමි , 1961:1090)

II. බුදුහු පෙරයම්හි ධම් දෙසා, මැදියම්හි දෙවියන් **පුළුවුත් පැන විසජා**, අලුයම්හි පළමුවන භාගයෙහි **සිංහශය්‍යා කොට,** දෙවන භාගයෙහි පලසමවතින් දවස් යවා, තුන්වන භාගයෙහි **මහ කුලුණුසමවත්** සමවැද **විනේ ජනයන්** බලා, නාලාගිරි දමනයෙහි **සුවාසූදහසක්** දෙනා හට අභිසමය වන සේ දැකැ, පහන් වූ කල සිරිරු **පිළිදැගැ**, අනඳ මහතෙරුන් කැඳවාගෙණ "අනඳ, අද රජගහානුවර පිරිවරා සිටි **අටළොස් වෙහෙර** හැම මහණුන් මා හා සමග

රජගහා **වදනට** කියා"යි වදාළහ. මහ තෙරහු එසේ කළහ. හැම සඟහු වේළුවන වෙහෙරැ රැස්වූහු.

(සෝරත හිමි, 1954 :140)

මහ තෙරුන් හිඳ **සස්** කළ තන්හි **පිලක්** කළහ. **මූෂිගර්භ වූ** තිරිසන් ගතියැ සත්හු දු ඇරැ එහි **හොවති**. එවිගසම සුවයෙන් බර **මුසිත්**. යම්ක් දුර්බල ද, ගෙණ එන්නට නොහැකි ද, ඇයට පිල දෙව් දිය ඇර හිසැ ඔත්කලැ එකෙනෙහිම බර මුසී . සෙසු රෝග ද සන්හින්දි මේ කප සිටිනා පෙළහරයි.

(සෝරත හිමි , 1954: 82)

III. **සුගත්** මෙත් බෝස ත්
විදුරත් **තිනෙත්** පියුම ත්
ගහනත් **තිනෙත්** පු ත්
මෙසත් සුර සත් ලොවට සෙත් දෙ ත්
(ගුණවර්ධන, 1916 :4පද්‍යය: 6)

සිතුම්ණි **බඳුරු** ක ළ
**කලබ** තිළිණෙන් පසුක ළ
පුරන දන මන දො ළ
තමා **සුරතම** සුරතුරක් ක ළ
(ගුණවර්ධන 1916 :8පද්‍යය: 9)

IV. මිතුරු තුරු සරහන- ම මිතුර **නව වසත** යුරු
නුබිනෙන සඳෙහි නඳ මද මද පවන ලෙළී

හෙබි **පුල් කුමුදු** හැඟැ නොගතු ද අතිනිගිළී
සුරගඟිනළ නෙලුඹු -දැළි **සඳ හස** නො වෙත පත

සුදු බුදු නිවෙසිනෙන තොප දැක ලෙව් එසඳ
සුදු බුදු රස් පිඬෙකැයි නොකොළෝ ද පුද

සඳෙකින් **නඳුනුයනිනෙන** මලෙක සුරනඹේ
සඳෙකින් ලොබින් වටලා නොදැමූ ද ඉඹේ
නිදුකින් අවුද සකිසඳ අතරමඟ නුඹේ
**ඉතකින්** අපට සැප නම් දැක්මමැයි නුඹේ

(තිලකසිරි, 2014: 2පද්‍යය:1)

2. බුත්සරණ කතුවරයා අවස්ථා හා චරිත නිරූපණයෙහිලා දක්වන සාමර්ථ්‍යය සනිදර්ශනව අගයන්න.

3. "පරෙවි සන්දේශය සමකාලීන සමාජ පරිසරය අධ්‍යයනය කිරීම සඳහා ආශ්‍රය කළ හැකි ප්‍රාමාණික සාහිත්‍ය මූලාශ්‍රයකි" මේ කියමනේ සත්‍යාසත්‍යතාව විභාග කරන්න.

4. පන්සිය පනස් ජාතක පොතේ කර්තෘ හා කාලය පිළිබඳ විද්වතුන්ගේ මත සමාලෝචනය කොට ඒවායේ යුක්තියුක්තතාව පෙන්වා දෙන්න.

5. පන්සිය පනස් ජාතක පොතේ සැකැස්ම පිළිබඳ 'වින්ටර්නීට්ස්' හා 'ආනන්ද කුලසූරිය' දරන ස්ථාවරය විමසන්න.

6. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට (02) කෙටි සටහන් සපයන්න.

   I. බුත්සරණේ උපමා
   II. ගුත්තිල කාව්‍ය හා මූලාශ්‍රය ජාතකය
   III. ඡද්දන්ත ජාතකය
   IV. ශ්‍රී රාහුල මාහිමි
   V. සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ ස්වරූපය